# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,381 - 2024 අප්‍රේල් මස 19 වැනි සිකුරාදා - 2024.04.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | — |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 132 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මීන් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2024 මැයි මස 10 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 අප්‍රේල් මස 26 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**206 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

131- B 082561 — 353 (2024/04)
D 1 -

# විවිධ දැන්වීම්

## පාර්ලිමේන්තුව

### ශ්‍රී ලංකාවේ කොළඹ හෙට්ටි සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

(වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 53 (1) යටතේ "ශ්‍රී ලංකාවේ කොළඹ හෙට්ටි සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි'' යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී සංගමය සංස්ථාගත කිරීමයි :-

*(අ)* සෑම අංශයකින්ම කොළඹ හෙට්ටි ප්‍රජාවගේ අවශ්‍යතා සහ සුබසාධනය ප්‍රවර්ධනය කිරීම සහ පෝෂණය කිරීම ;

*(ආ)* එහි සාමාජිකයින්ට සමාජ අන්තර් අධ්‍යයනය, සමාජ සම්බන්ධතා සහ විනෝදාස්වාදය සඳහා සහභාගීවීමට අවස්ථාව ලබාදීම ;

*(ඇ)* අවශ්‍යතා ඇති සිසුන්ට ඔවුන්ගේ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය වැඩිදියුණු කිරීම සඳහා ආධාර සැපයීම

යනාදිය වේ.

විශේෂඥ වෛද්‍ය සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ,<br>
ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රිනී.

04-343

---

## පාර්ලිමේන්තුව

### ශ්‍රී ලංකා උසස් අධ්‍යාපන ඵලදායිතාව වැඩි දියුණු කිරීමේ සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

අජිත් මාන්නප්පෙරුම වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ අංක 53 (1) දරන ස්ථාවර නියෝගය යටතේ "ශ්‍රී ලංකා උසස් අධ්‍යාපන ඵලදායිතාව වැඩි දියුණු කිරීමේ සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි'' යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී සංගමය සංස්ථාගත කිරීමයි :-

*(අ)* ශ්‍රී ලාංකේය විශ්වවිද්‍යාලවල අධ්‍යාපනික සංවර්ධනයේ දැනටමත් පවතින මෙන් ම නැගී එන අංශවලට සහාය වීම ;

*(ආ)* සමාජීය වශයෙන් අදාළ උසස් අධ්‍යාපන ප්‍රතිපත්තිය විශ්වවිද්‍යාල පරිචයක් දක්වා මාරු කිරීමට සහාය වීම ;

*(ඇ)* විශ්වවිද්‍යාල පසුබිම තුළ ඉගැන්වීම, ඉගෙනීම සහ කළමනාකරණය පිළිබඳ වත්මන් සහ නැගී එන අදහස් සහ තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා පොදු වේදිකාවක් සැපයීම

යනාදිය වේ.

අජිත් මාන්නප්පෙරුම,<br>
පාර්ලිමේන්තු මන්ත්‍රී.

04-347

## පාර්ලිමේන්තුව

### සදහම් සිතුවිලි පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

උදයන කිරිඳිගොඩ වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 53 දරන ස්ථාවර නියෝගය යටතේ "සදහම් සිතුවිලි පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි'' යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී පදනම සංස්ථාගත කිරීමයි :-

*(අ)* ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා අධ්‍යාපන ආයතන සහ නේවාසිකාගාර පිහිටුවා නඩත්තු කිරීම ;

*(ආ)* දුප්පත් ළමුන්ගේ අධ්‍යාපනය නංවාලීම සහ ප්‍රවර්ධනය කිරීම, ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ආයතනවලට අනුග්‍රහය ලබාදීම ;

*(ඇ)* ස්වාභාවික ආපදාවල දී ඒවාට ලක් වූ අයට අවශ්‍ය ආධාර කිරීම ;

යනාදිය වේ.

උදයන කිරිඳිගොඩ,
පාර්ලිමේන්තු මන්ත්‍රී.

04-344

---

### සිය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාතේ මහාධිකරණයේ දී ය

නඩු අංකය : CHC/11/2024/CO
ස්වභාවය : ඈවර කිරීම

2007 අංක 07 දරන සමාගම් පනතේ XII කොටස යටතේ කොළඹ 07, රීඩ් ඇවනියු, අංක 14 හි පිහිටි, සමාගම් ලියාපදිංචි කිරීමේ අංක PV 64628 දරන ඊස්ටර්න් ඩිවලොප්මන්ට් එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ් නම් සමාගම ගරු අධිකරණය විසින් ඈවර කරනු ලැබීම සඳහා වූ ඉල්ලීම සම්බන්ධයෙන් වන කාරණයේ දී ය.

ස්ටැසන් එක්ස්පෝර්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 833,
සිරිමාවෝ බණ්ඩාරනායක මාවත,
තැ. පෙ. 1970, කොළඹ 14.

*.....................පෙත්සම්කරු.*

බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණය විසින් ඉහත නම් සඳහන් සමාගම ගණන් බේරා වසා දැමීම පිණිස වර්ෂ 2024 ක් වූ ජනවාරි මස 31 වැනි දිනැතිව පෙත්සමක්, වර්ෂ 2024 ක් වූ පෙබරවාරි මස 01 වැනි දින එකී අධිකරණය වෙත පෙත්සම්කරු වෙනුවෙන් නීතිඥ කේ. උපේන්ද්‍ර ගුණසේකර වන මා විසින් ඉදිරිපත් කර ඇති බව ද, එකී පෙත්සම වර්ෂ 2024 ක් වූ ජූනි මස 03 වැනි දින අධිකරණය ඉදිරියෙ හි විමසීමට නියම කර ඇති බව ද, එකී පෙත්සම මත නියෝගයක් කිරීම තහවුරු කිරීමට හෝ ඊට විරුද්ධ වීමට හෝ කැමති එකී සමාගමේ කිසියම් ණය හිමියෙකු හෝ සහදායකයකු වේ නම් ඒ තැනැත්තාට තත්කාර්ය සඳහා එය විමසීමට ලක් කරන අවස්ථාවෙ හි පෞද්ගලිකව හෝ තමාගේ නීතිඥවරයා මාර්ගයෙන් හෝ පෙනී සිටිය හැකි බව ද, පෙත්සමේ පිටපතක් අවශ්‍ය වන එකී සමාගමේ ඕනෑම ණය හිමියෙකුට හෝ සහදායකයකුට ඒ සඳහා නියමිත ගාස්තුව ගෙවූ විට සපයනු ලබන බව ද, මෙයින් දැනුම් දෙනු ලැබේ.

කේ. උපේන්ද්‍ර ගුණසේකර,
පෙත්සම්කරුගේ නීතිඥ,
අංක 135 1/3, ගුණසිංහපුර කාර්යාල සංකීර්ණය,
ශාන්ත සෙබස්තියන් වීදිය,
කොළඹ 12.

*සටහන :* එකී පෙත්සම විමසීමට ලක් කරන අවස්ථාවෙ හි පෙනී සිටීමට කැමති ඕනෑම තැනැත්තෙකු විසින් තමා එසේ කිරීමට අදහස් කරන බවට ලිඛිත දැන්වීමක් නීතිඥ කේ. උපේන්ද්‍ර ගුණසේකර වන මා වෙත භාර දිය යුතු ය. *නැතහොත්* තැපෑලෙන් එවිය යුතුය. එම දැන්වීමෙ හි එම තැනැත්තාගේ නම සහ ලිපිනය ද, ව්‍යාපාර ආයතනයක් නම් ව්‍යාපාර ආයතනයේ නම සහ ලිපිනය ද සඳහන් කළ යුතු අතර, එය එම තැනැත්තා හෝ ව්‍යාපාර ආයතනය විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ (නීතිඥවරයෙකු වෙතොත්) එම නීතිඥවරයා විසින් අත්සන් කළ යුතුවාක් මෙන්ම 2024 ක් වූ ජුනි මස 02 වැනි දින සවස 06 ට පෙර ලැබෙන ලෙස භාර දිය යුතු ය. *නැතහොත්* තැපෑලෙන් එවන්නේ නම් එදින එකී වේලාවට පෙර ලැබෙන ලෙස කල්වේලා ඇතිව තැපැල් කළ යුතුය.

04-350

---

**බස්නාහිර පළාත් මහාධිකරණයේ දී ය**

(කොළඹ දී පැවැත්වෙන සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන)

2007 අංක 07 දරන සමාගම් පනතේ XII කොටස යටතේ බත්තරමුල්ල, කඩුවෙල පාර, තලාහේන උද්‍යානය, අංක 525/8 දරන ස්ථානයේ පිහිටි සමාගම් ලියාපදිංචි අංක PV15106 දරන යුනි වෝකර් පැකේජිං එක්ස්පෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (UNI Walker Packaging Exports (Private) Limited) නැමති සමාගම අධිකරණය මගින් ඈවර කරනු ලැබීම සඳහා වූ ඉල්ලීමකි.

නඩු අංකය : CHC/17/2024/CO
ස්වභාවය : ඈවර කිරීම

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.,
අංක 21, ශ්‍රීමත් රසික් ෆරීඩ් මාවත,
කොළඹ 01.

*සහ*

කොළඹ 01, ශ්‍රීමත් රසීක් ෆරීඩ් මාවත, අංක 21 දරන ස්ථානයෙ හි ''විදේශීය ශාඛාව'' වශයෙන් හඳුන්වන ශාඛා කාර්යාලයක් සහ/හෝ ව්‍යාපාරික ස්ථානයක් පිහිටා ඇත.

*.......................පෙත්සම්කරු.*

බස්නාහිර පළාත් මහාධිකරණයේ දී ය (තම සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පවත්වනු ලබන) ඉහත නම සඳහන් සමාගම ගණින් බේරා වසා දමනු ලැබීම සඳහා,

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී,
අංක 21, ශ්‍රීමත් රසීක් ෆරීඩ් මාවත,
කොළඹ 01.

විසින් 2024 පෙබරවාරි මස 29 වැනි දින එකී අධිකරණය වෙත පෙත්සමක් ඉදිරිපත් කරන ලද බවත්, එකී පෙත්සම 2024 ජුනි මස 27 වැනි දින එකී අධිකරණය ඉදිරියේ ඇසිය යුතු බවට නියම කර ඇති බවත්, එකී පෙත්සම මත නියෝගයක් කිරීමට සහයෝගය හෝ විරෝධය හෝ දැක්වීමට කැමති එකී සමාගමේ යම් ණය හිමියෙකු හෝ දායකයෙකු එකී පෙත්සම අසන වේලාවේ දී පුද්ගලිකව හෝ අධිනීතිඥ හෝ ලේඛනගත නීතිඥයෙකු මගින් එම අරමුණ වෙනුවෙන් පෙනී සිටීමට හැකි බව මෙයින් දන්වනු ලැබේ. තව ද, පෙත්සමේ පිටපතක් ඒ සඳහා නියමකර ඇති ගාස්තු ගෙවීම මත එය අවශ්‍යවන සමාගමේ යම් ණය හිමියෙකුට හෝ දායකයෙකුට පහත අත්සන් කරන අය විසින් සපයනු ලබන්නේ ය.

නීතිඥ මොහොමඩ් කලීල් මොහොමඩ් ඉර්ෂාඩ්,
පෙත්සම්කරුගේ නීතිඥ,
අංක 180, බෞද්ධාලෝක මාවත,
කොළඹ 04.

*සටහන :-*

එකී පෙත්සම ඇසීමේ දී පෙනී සිටීමට අදහස් කරන යම් පුද්ගලයෙකු එසේ කිරීමට ඇති ඔහුගේ/ඇයගේ එම අදහස, ඉහත නම සඳහන් නීතිඥ, මොහොමඩ් කලීල් මොහොමඩ් ඉර්ෂාඩ් යන අය වෙත ලිඛිතව භාරදීම හෝ තැපැල් මගින් එවීම කළ යුතු ය. පුද්ගලයින්ගේ නම් සහ ලිපිනය හෝ නීති ආයතනයක් නම් එහි නම සහ ලිපිනය හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ ලේඛනගත නීතිඥයින් ඇත්නම් ලේඛනගත නීතිඥවරයාගේ නම සහ ලිපිනය නොතීසියේ සඳහන් කිරීම අවශ්‍යවන අතර, 2024 ජුනි මස 26 වැනි දින පස්වරු 6.00ට පෙර ඉහත නම් සඳහන් අයවලුන්ට ලැබෙන සේ කල්වේලා ඇතිව භාර කිරීම හෝ තැපැල් කරනුයේ නම්, එසේ තැපැල් කිරීම අවශ්‍ය වේ.

04-349

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.